**ගාලු උරුමය පදනම - 2022**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ගාලු උරුමය පදනමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ගාලු උරුමය පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ගාලු උරුමය පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ගාලු උරුමය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ගාලු උරුමය පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ගාලු උරුමය පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතානාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් දරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ගාලු උරුමය පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ගාලු උරුමය පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ගාලු උරුමය පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 880 හා 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 07 දරන චක්‍රලේඛයෙහි 06 ඡේදය | මුදල් හෝ තොග සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා බලය ලබාදී ඇති සියලුම නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවද ගාලු උරුමය පදනමේ ගණකාධිකාරී, ප්‍රදර්ශන කුටි වල සහ තොරතුරු මධ්‍යස්ථානයේ සිටින නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි. | ඉහත නිලධාරීන්ගෙන් ඇප තැන්පතු මුදල් රඳවා ගැනීමට ක්‍රියා කරන බව කාරුණිකව දන්වා සිටිමි. | යොමුගත නීතිරීති ප්‍රකාරව අදාළ නිලධාරීන්ගෙන් ඇප තැන්පතු මුදල් රඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**
**මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,411,764 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.584,118 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,995,882 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.2,442,667 ක කුලී ආදායමක් ලැබීම හා ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම රු.1,267,780 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බ්‍රිතාන්‍ය පාලන අවධියේ කම්කරු සුපරීක්ෂකයින්ගේ නේවාසිකාගාරයක් ලෙස භාවිතා කර තිබුණු ගොඩනැගිල්ලක් 2018 වර්ෂය දක්වාම පොලිස් නිලනිවාසයක් වශයෙන් භාවිතා කර තිබුණු අතර වාණිජ කටයුතු සඳහා යෙදවීමේ අරමුණින් ගාලු උරුමය පදනම වෙත භාරදී තිබුණ ද 2023 මාර්තු 23 විගණිත දිනය වන විටත් එම අරමුණ ඉටු කරගෙන නොතිබුණි. | 2023 මුල් කාර්තුව තුළ ගොඩනැගිල්ලේ සංරක්ෂණ කටයුතු නිමා කර ඇත. 2023 අප්‍රේල් මස ප්‍රසම්පාදන කටයුතු කර මැයි මස සිට සුදුසු ආයෝජකයින් සඳහා ගොඩනැගිල්ල භාර දීමට අපේක්ෂා කරමි. මැයි මස සිට ගොඩනැගිල්ලෙන් ආදායම් ලබා ගැනීමට නියමිතය. | ගොඩනැගිල්ල වාණිජ කටයුතු සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගාලු උරුමය පදනමට, වැඩි බලතල ලබා ගැනීමට හා ආදායම් උත්පාදන අවස්ථා නංවාලීම අරමුණු කොට ගෙන සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණි. ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර වසර 10 ක් ගතවී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පනත සංශෝධනය කර නොතිබුණි. | මේ වන විට පනත සංශෝධන කටයුතු සිදු කරගෙන යමින් පවතී. | පනත කඩිනමින් සංශෝධනය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රවේශ පත්‍ර අලෙවි කර ආදායම් උපයන තුලින් සංචාරක නැරඹුම් ස්ථානයක් වන ‘කලු කොටුව’ ගාල්ල නියෝජ්‍ය පොලිස්පති කාර්යාල පරිශ්‍රය තුල පිහිටා ඇති බැවින් නැරඹුම් ස්ථානයට ප්‍රවේශ වන මාර්ගය නිරන්තරයෙන් ගේට්ටුවකින් වසා තිබෙන බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම සංචාරක ස්ථානය තුලින් ගාලු උරුමය පදනමට ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය නොවන බව නිරීක්ෂණය විය. | උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සකස්කර සවිකරනු ලැබූ දැනුම්වත්කිරීමේ පුවරු මඟින් ඉතා පහසු වෙන් ඕනෑම ස්ථානයක් හඳුනා ගැනීමට හැකිවන ලෙස සකස්කර ඇත. කළු කොටුවේ නියෝජ්‍ය පොලිස්පතිගේ නිළ නිවාසය සහ කාර්යාලය පිහිටා තිබීම නිසා ආරක්ෂාවට ගේට්ටුව යොදා ඇත. එහෙත් කළුකොටුවේ ප්‍රදර්ශන මැදිරි සංචාරකයින්ට නැරඹීම සඳහා බාධාවක් නොමැත. බොහෝ අවස්ථාවල සඳු ගැලරියෙන් හෝ තාරකා ගැලරියෙන් පොදු ටිකට්පත් ලබාගෙන සංචාරකයෝ කළුකොටුව නරඹති. | නැරඹුම් ස්ථානයට සංචාරකයින්ට බාධාවකින් තොරව පහසුවෙන් ප්‍රවේශය විය හැකි පරිදි මාර්ගය සකසා දිය යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගාලු උරුමය පදනමේ තෘතියික මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු පවතින අතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වැටුප් ලබන සේවකයන් 06 දෙනෙකුද, බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් වැටුප් ලබන සේවකයන් 02 කුද, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වැටුප් ලබන සේවකයන් 02 කුද අතිරික්ත සේවයේ යොදවා තිබුණි. | ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ NH/Secretary/01 හා 2021-01-20 දිනැති ලිපිය අනුව පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇත. | පුරප්පාඩු හා අතිරික්ත තනතුරු විධිමත්ව කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුය. සමාලෝචිත වර්ෂයට අදාළව ගාලු උරුමය පදනම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද, එක් තිරසර සංවර්ධන ඉලක්කයක් හැර ගාලු කොටුව ආරක්ෂා කර ගනිමින් දේශීය හා විදේශිය සංචාරක ආකර්ෂණය තුලින් තවදුරටත් අවධානය යොමු කළ හැකි තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | 2022 වර්ෂය සහ 2023 වර්ෂයේ ගාලු උරුමය පදනම මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ එකම ව්‍යාපෘතිය වූයේ ඉපැරණි ගොඩනැඟිල්ලක් වූ පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කර ශ්‍රී ලංකාවට ආවේණික දේශීය කර්මාන්තකරුවන්, නිෂ්පාදකයන් නඟා සිටුවමින්, ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කරමින්, ගාලු උරුමය පදනමේ ප්‍රමුඛ ආදායම් මාර්ගයක් ඇති කිරීමය. ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණ 8.9 ළඟා කරගෙන ඇති බව දන්වමි. | තිරසර සංවර්ධන ඉලක්ක 8.9 වෙනුවෙන් පමණක් අවධානය යොමු කර ඇති නමුත් තවදුරටත් අවධානය යොමු කළ හැකි ක්ෂේත්‍ර හඳුනාගෙන පවතින බැවින් එම ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරමින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට හැකි වාර්ෂික සැලසුම් සකස් කළ යුතුය. |